# ලංකාවේ රූකඩ කලාව හා එහි අනාගතය

ජේ. තිලකසිරි



මහදනමුත්තා
රූකඩ නැටුමෙන්

ලංකාවේ රූකඩ කලාව පැරණි ඉතිහාසයක් ඇති ඊට ම ආවේණික වූ සම්ප්‍රදයයන් සහිත අනගි ජන කලාවකි. අතීතයෙහි ඉතාමත් ම ජනප්‍රියව පැවත ආ නාඩගම් නාට්‍ය සම්ප්‍රදයයට සම්බන්ධ කොට ඉදිරිපත් කරන ලද රූකඩ නාට්‍යය ඒ නිසා ම පිරිහී ගිය බැව් පෙනේ. නාඩගම් සිංදු පසු බිම් කොට ගෙන නාඩගම් දෙබස් සහිතව රූකඩ නැටුම් රඟ දක්වනු ලැබීම නිසා නාඩගමෙහි විශේෂ ලක්ෂණ රූකඩ නැටුම්වලට ප්‍රවේශවිය. නාඩගමට ගැබ්වූ නාට්‍ය සම්ප්‍රදයයන් ඉවහල් කරගත් රූකඩ ශිල්පීහු එය රූකඩ නාට්‍ය විලාසයට ගැළපෙන පරිදි සකස් කරගැනීමට උත්සාහ නොකළහ. රජවරු, බිසෝවරු, මැතිඇමතිවරු ආදී චරිත නාඩගම්වල රඟ දැක්වූ මිනිසුන්ගේ ප්‍රමාණයෙන් ම රූකඩ නිර්මාණයන්හි අද පවා දක්නට ලැබේ. මේ රූකඩ ක්‍රියාත්මකව රඟදැක්වීමට වඩා ප්‍රදර්ශනයක තබනලද ලීලාවෙන් වේදිකා ගත කරන ලදී. එහෙත් අප රූකඩ ශිල්පීන්ට ක්‍රියාත්මක රූකඩ තැනීමේ දක්ෂකමක් නොමැති වී යයි මෙයින් නිගමනය නොකළ යුතු යි. අප සමත් ශිල්පීන්ට රූකඩ කැපීමෙහි අද්විතීය නිපුණත්වයක් ඇත. අතුරු නැටුම් වශයෙන් ඇතුළු වූ **කෝනංගි, සෙල්ලපුල්ලේ** ආදි අංකවලට අයත් රූකඩ ප්‍රාණවත් නැටුම් විලාශයක් ගෙන හැර දක්වයි. විදනේ වැනි විකට ජවනිකාවලට යොදන ලද රූකඩ අප රූකඩ කලාවේ දක්ෂතම නිර්මාණ වශයෙන් ද ගිණිය හැකි ය. එහෙත් රූකඩ නැටුම් දියුණුවීමට අවශ්‍යවූ සෙසු නාට්‍ය අංග හා කලා ලක්ෂණ අතින් කිසිදු ප්‍රගතියක් ඇති නොවී ය. ගැමි නැටුම් හා කලා පිරිහීම සමඟ ම රූකඩ කලාව කෙරෙහි ද ගැමි ජනයාගේ රුචිකත්වය කෙමෙන් හීන විය. පාරම්පරිකව පවුල් කිහිපයකට සීමා වූ රූකඩ කලාව ඔවුන් විසින් ම දියුණු කළ යුතු විය. කලාවට තැනක් නොලැබීම නිසා ද ඔවුන්ගේ උදසීනභාවය නිසා ද එය වඩාත් පිරිහී ගියේය.

මෙසේ රූකඩ නාට්‍ය පිරිහී ඇත්තේ මෙහි පමණක් නොවේ. පූර්ව ආසියාවේ ම එබඳු පරිහානියක් දක්නට ලැබේ. ඉන්දියාව, බුරුමය, සියමය ආදි රටවල ද ඈත අතීතයේ උත්කර්ෂවත් විලාසයකින් ප්‍රචලිත වූ නූල් රූකඩ (marionette) ඡායා රූකඩ (shadow puppet) ආදි රූකඩ ක්‍රම අද දක්නට ලැබීම පවා දුෂ්කර ය. සමහර රටවල ඒවායේ නෂ්ටාවශේෂ වත් කෞතුකාගාරයක දක්නට නොහැක. එහෙත් භාග්‍යයකට මෙන් ඉන්දුනීසියාවේ ජාවා හා බාලි දූපත්වල අද පවා රූකඩ කලාව ශ්‍රේෂ්ඨ සම්භාවනීය තැනක් ගෙන පවතී. එය ජාවා රටෙහි නියම නාට්‍ය කලාවකි. එහි පැරණි සම්ප්‍රදාය හා ක්‍රම ඉතා පරෙස්සමින් රජය විසින් ද රූකඩ කලාකරුවන් විසින් ද රැක ගනු ලැබෙත්. හැම නගරයක ම වාගේ රූකඩ කලාකරුවන් රූකඩ නාට්‍යශාලා හා විවිධ රූකඩ වර්ග ද දක්නට ලැබේ. සිසුන්ට රූකඩ කලාව උගැන්වීමෙන් ද මහජනයා අතර එය ප්‍රචලිත කිරීමෙන් ද ඇතිවූ දියුණුව නිසා රූකඩ කලාව ඒ රටෙහි උසස් ම කලාව බවට පත්වී තිබේ.

රූකඩ නැටුම් ඉන්දියාව හා චීනය වැනි ආසියාතික රටවල මුලින් ම නිපදවන ලදැයි සමහර විචාරකයන්ගේ මතය යි. එහෙත් දැන් රූකඩ නැටුම් නියම නාට්‍ය ස්වරූපයකින් දියුණු වී පවතින්නේ ආසියාවෙන් ඒවා ප්‍රවේශ වූ යුරෝපීය රටවල් කිහිපයක ය. රූකඩ නාට්‍ය කලාව නවීන ක්‍රම අනුව උසස් ලෙස දියුණු කිරීමෙහි පුරෝගාමී වූයේ රුසියාව හා චෙකොස්ලොවැකියාව ය. රුසියාවේ විශේෂ කලාවක් ලෙස දියුණු වී ඇත්තේ දඬු රූකඩ (rod puppet) කලාව යි. මොස්කව් රූකඩ නාට්‍ය ශාලාවෙහි දිනපතා දැකිය හැකි මේ වර්ගයේ රූකඩ නාට්‍ය චමත්කාර ජනක, රසවත් නිෂ්පාදනයෝ ය. චෙකොස්ලොවැකියාවේ නූල් රූකඩ කලාව ද රූකඩ චිත්‍රපටි කලාව ද ශ්‍රේෂ්ඨ ලෙස දියුණු වී ඇත. ජර්මනියෙහි ප්‍රන්සයෙහි නගර කිහිපයක ම ඒ ඒ රූකඩ වර්ග වලින් නිපදවන ලද රූකඩ නාට්‍ය පහසුවෙන් නැරඹිය හැකි ය. යුරෝපීය රටවල මෙසේ භාවිත වී සම්මතව ඇති රූකඩ නිර්මාණ ක්‍රම හා නිෂ්පාදන විධි සමහරක් අප රූකඩ නැටුම්වලට ද යෝග්‍ය ය. ඒවා අන්හද බලා යෙදීමෙන් රූකඩ නාට්‍ය කලාව දියුණු කළ හැකි ය.

ලංකාවේ රූකඩ කලාවේ මූලස්ථානය අම්බලන්ගොඩ ය. අද එහි රූකඩ නැටුම් ඉදිරිපත් කරන ප්‍රසිද්ධ රූකඩ කණ්ඩායම් දෙකක් ගැන පමණක් සඳහන් කළ හැකිය. කණ්ඩායම් කිහිපයකින් ඉතිරි වී ඇත්තේ මේ දෙක පමණකි. මේ කණ්ඩායම් දෙකෙහි රූකඩ කලාකරුවෝ ද ඉතා අමාරුවෙන් සිය කලාව රැක ගෙන යති. මොවුන්ගේ කලාවේ පරිහානියට හේතු වී ඇති කරුණු පිරික්සා බැලීමෙන් රූකඩ කලාව ප්‍රතිසංස්කරණය කළ යුතු අයුරුත් එහි අනාගත දියුණුව ගැනත් අපට පැහැදිලිව සිතා ගත හැකි වේ.

පැරණි ක්‍රම අනුව ඉදිරිපත් කරනු ලබන රූකඩ නැටුම් දැන් එතරම් ජනප්‍රිය නොවීමට ප්‍රධාන හේතුව එහි කිසි ම අළුත් මුහුණුවරක් දක්නට නොලැබීම යි. සාමාන්‍යයෙන් මහජනයා ගම්වල රූකඩ නැටුම් බැලීමට පුරුදුව ඇත්තේ නොමිලයේ ය. නගරයෙහි එය අගේ නො කරන ලදී. අළුත් නාට්‍යයක් හෝ අළුත් රූකඩ වර්ගයක් හෝ මහජනයාට දක්නට නොලැබේ. අවුරුදු ගණනකට උඩදී භාවිත කරන ලද ශ්‍රී වික්‍රම හෝ ඇහැලේපොළ හෝ වෙනත් රූකඩ සහිත රූකඩ නැටුම් ඒ විදියට ම අද ද වේදිකා ගත වේ. වෙනසක් ඇත්නම් රූකඩ මුහුණුවල පරණ සායම් වෙනුවට අළුත් සායම් ආලේප කිරීමක් පමණයි. කලාත්මකකමින් අඩු වූ මේ නැටුම් බැලීමට වඩා චිත්‍රපටියක් බලා ආස්වාදය ලැබීමට ගැමි ජනයා ද පුරුදුව සිටී.

මෑතක් වන තුරු රජයෙන් මේ කලාවට කිසි ම රුකුලක් හෝ ආධාරයක් නොලැබිණ. රූකඩ කලාව අගය කරන නිලධාරීන් නොමැති වීම ද පිරිහුණු කලාවේ ලක්ෂණ දුටු නිලධාරීන්ට එයට ආධාර කිරීමට පවා උදාසීන වීම ද මෙයට හේතු විය. මීට අවුරුදු දෙකකට පෙර රූකඩ කලාකාමීන් කිහිපදෙනෙකුගේ බලවත් ඉල්ලීම නිසා ලංකා කලා මණ්ඩලයේ පහතරට නැටුම් හා සංගීත අනුමණ්ඩලයට සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආධාරයකින් රූකඩ කලාව උගැන්වීම රුහුණු කලායතනයෙහි අරඹන ලදී. අළුත් රූකඩ නාට්‍යයක් නිපදවීම සඳහා ද කටයුතු පිළියෙල කරන ලදී. මෙතෙක් පැරණි නාඩගම් කථාවන්ට සීමා වූ රූකඩ නැටුම් පළමුවරට ජන කථාවක් ඇසුරුව රූකඩ නාට්‍යයක් ලෙස නිපදවීමට තීරණය කරන ලදී. කවුරුත් දන්නා **මහදැනමුත්තා සහ ගෝල පිරිස** නම් කථාවෙහි පුවත් කිහිපයක් මේ නාට්‍යයට විෂය විය. මෙවැනි පියවරක් ගැනීමේ දී නවීන රූකඩ කලාවේ ප්‍රධාන ප්‍රයෝජන දෙකක් ගැන

සිතන ලදී. යුරෝපීය රටවල රූකඩ කලාව දියුණු වී ඇත්තේ රූකඩ නාට්‍ය කලාවක් ලෙස ය. ලොකු කුඩා කාටත් රුචි වන ගැමි කථා රූකඩ නාට්‍ය නිෂ්පාදනයෙහි බෙහෙවින් ම යොද ඇත. නව ද රූකඩ නැටුම් ඉදිරිපත් කළ යුත්තේ රූකඩවලට යෝග්‍ය වූ නාට්‍ය විලාසයෙනි. එසේ නාට්‍යයක් ලෙස ඉදිරිපත් කිරීමේ දී නාට්‍යයකට අවශ්‍ය සියළු අංගයන්ගෙන් ම එය බප් නැගිය යුතු යි. එහෙයින් නූල් රූකඩ නාට්‍යයකට සුදුසු, වේදිකාවක් ද, තිර ද, වේදිකා ආලෝක ද **මහදනමුත්තා** නාට්‍යය නිපදවීමේ දී අළුතෙන් ම සාද ගන්නා ලදී. කොතැනක වුවත් ගෙන ගොස් සවිකළ හැකි වේදිකාවක් තැනීමෙන් රූකඩ ශිල්පීන්ට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන දුෂ්කරතාවක් ද මග හරිනා ලදී.

ඉහත සඳහන් නාට්‍යයට රූකඩ තැනීමේදී ද ඒවා ක්‍රියා කරවීමේදී ද නව මගක් අප විසින් ගන්නා ලදී. දැනට අම්බලංගොඩ සිටින දක්ෂ රූකඩ ශිල්පියකු ලවා මේ නාට්‍යයට අවශ්‍ය රූකඩ කපන ලදී. රූකඩ අඩි $2\frac{1}{2}$ ක පමණ උසට තනන ලදී. සාමාන්‍යයෙන් ලංකාවේ රූකඩ අඩි 4 ක් හෝ සැබෑ මිනිස් උසට ම තනන ලද හෙයින් ඒවා ක්‍රියා කිරීමේ ශක්තිය හීන වන අතර ම බොහෝ අවස්ථාවන්හි ඉදිරියේ ළඩ තිරයට වැසී රූකඩ නොපෙනී යනු ලැබේ. රූකඩ සායම් කිරීම සඳහා පැරණි කලාකරුවන් සොයා ගෙන භාවිත කළ සායම් වර්ග වෙනුවට දැන් යොදනුයේ එතරම් යෝග්‍ය නොවූ රට ලැකර් සායම් වර්ග ය. මෙය යෝග්‍ය නොවන බව අපේ හැඟීම යි. එහෙයින් තෙල් සායම් සංයෝගකොට මේ අළුත් රූකඩ සායම් කරන ලදී.

රූකඩ ක්‍රියාකරවීමේදී අපට බටහිර ක්‍රමය අනුව සකස් කරන ලද ලී සැලසුම් යොදන්නට සිදු විය. රූකඩ නැටවීමට සාමාන්‍යයෙන් අප ශිල්පීන් භාවිත කරන්නේ ලී දෙකක් හරස් කොට ගැට ගසා එයට නූල් හතරක් යොද සකස් කරගත් සැලැස්මකි. මෙයින් රූකඩයේ නියම ක්‍රියාකාරී ශක්තිය අඩු වී ඇති හෙයින් මේ අළුත් සැලසුම්වලින් රූකඩය නිසි ලෙස ක්‍රියාත්මක කරවීමට හැකි වේ. රූකඩයක් මිනිසකු ඇවිදින ආකාරයට ඇවිද්දවීමත්, කථා කරන විට ඊට සුදුසු ලෙස හිස ඒ මේ අත සෙලවීම හා සිරුරේ අඟ පසඟ භාවික ලෙස සෙලවීමත් මේ බටහිර ලී සැලසුම් අනුව කළ හැකි වේ. රූකඩයක ක්‍රියා කිරීමේ ශක්තියත්, ප්‍රාණවත් ගතියක් හඟවන ශක්තියත් නොමැති නම් එය ලී පිළිමයක් හෝ බෝනික්කකු විනා ජීව රූකඩයක් නොවේ. අපේ පැරණි නැටුම් රූකඩ හැර සෙසු රූකඩවල පැහැදිලිව පෙනෙන දුර්වලකම්



මහදනමුත්තා හා ගෝල පිරිස

එය යි. එය මහහරවා ගැනීමට අප විසින් නවීන ලී සැලසුම් තනාගැනීම හෝ පැරණි ලී සැලසුම් අළුත් ක්‍රමයකට සකස්කර ගැනීම හෝ කළ යුතු වේ.

මේ අළුත් රූකඩ නාට්‍යය නිපදවීමේදී අපට ප්‍රත්‍යක්ෂ වූ තවත් වැදගත් කරුණක් නම් පාසැල් සිසුනට හා සාමාන්‍යයෙන් බාල පරම්පරාව අතට මේ කලාව කෙමෙන් පත්කිරීමේ අවශ්‍යතාව යි. රූකඩ කලා ප්‍රතිසංස්කරණයක පරමාර්ථය එය ම විය යුතු යි. අම්බලන්ගොඩ කලායතනයෙහි රූකඩ නැටවීම උගත් සිසුන් එය වැඩි හිටියන්ට වඩා පහසුවෙන් ඉක්මනින් ක්‍රමවත්ව හැදෑරූ බව පැහැදිලි විය. මෑතකදී පළමුවන වරට පාසැල් සිසුන් මේ කලාව උගත් අවස්ථාව මෙය බැව් අපේ හැඟීම යි. එයින් පෙනියන්නේ මේ කලාව ක්‍රමවත්ව තරුණ පරම්පරාවට ඉගැන්වීම කළ යුතු බවයි.

**මහදැනමුත්තා** රූකඩ නාට්‍යය නිපදවීම අත්හදාබැලීමක් වශයෙන් කරන ලද්දකි. එයින් අප ලැබූ අත්දැකීම් අනුව රූකඩ කලාවේ අනාගතය පිළිබඳව දැන් යමක් පැවසීමට උත්සාහ කරන්නෙමු. රූකඩ කලාවේ ප්‍රගතිය අගේ කරන සෑම කෙනෙකු ම එය නවීන ක්‍රම අඩංගු කොට දියුණු කළ යුතු බව වටහා ගත යුතු යි. පැරණි කලාවක් හැටියට එය මෙතෙක් අඩ පණ වී රැකී තිබේ. දැන් එයට නිසි තැන ලබාදීමට කාලය යි. අම්බලන්ගොඩට පමණක් සීමා වී ඇති මේ කලාව කොළඹ කලායතනයෙහි හා නුවර කලායතනයක ද වෙනත් කලාවන් මෙන් හැදෑරිය යුතු කලාවක් ලෙස උගැන්විය යුතු යි. පැරණි කලාකරුවන්ගේ උපදෙස් අනුව රූකඩ නිර්මාණය, කැපීම, හැඩ වැඩ කිරීම, සායම් කිරීම ද, එය වේදිකාවෙහි නැටවීමට සුදුසු ලෙස නූල් යොදා සකස්කිරීම ද නැටවීමට පුහුණු කිරීම ද ක්‍රමානුකූලව උගන්වන අභ්‍යාස පංක්ති කලායතනයක පැවැත්විය යුතු ය. එය පහසුවෙන් ම කලායතනවල කළ හැකි වන්නේ දැනට ම මීට සම්බන්ධ කලාවන් කිහිපයක් ගැන ඉගැන්වීමක් එම ආයතනයන්හි ලැබෙන නිසා ය. රූකඩ නාට්‍ය කලාව පිළිබඳව ද ක්‍රමවත් අධ්‍යාපනයක් එවැනි ආයතනයකින් ලබා ගත යුතු ය. මෙසේ රූකඩ කලාවට තැනක් ලැබීම නිසා අපේ රූකඩ කලාකරුවන්ට ද තැනක් ලැබේ. ඔවුන් විසින් අළුත් ක්‍රම ගැන ද රූකඩ නාට්‍ය කලාව ගැන ද අවබෝධයක් ලබා ගත යුතු ම යි. අළුත් ක්‍රම අත්හදා බලා ඒවා යොදා ගැනීමෙන් රූකඩ කලාව දියුණු කර ගත යුතු බව ඔවුන්ට වැටහෙනු නොඅනුමානයි.

මෙසේ රූකඩ කලාව පිළිබඳ පුහුණුවක් ලත් කලාකරුවන් බිහි කිරීම සමඟ ම සිසුන්-විසින් උගත යුතු විෂයයක් ලෙස පාසැල්වල ද එය හැදෑරීමට මං සැළසිය යුතු යි. එංගලන්තය, අමෙරිකාව, චෙකොස්ලොවේකියාව, රුසියාව හා ජර්මනිය ආදී රටවල රූකඩ ශිල්පීන් හා අධ්‍යාපනඥයින් බෙහෙවින් ම රූකඩවල අධ්‍යාපනමය ප්‍රයෝජනය ගැන අවබෝධයක් ලබා ගෙන ඇති හෙයින් අධ්‍යාපනමය රූකඩ කලාව ශීඝ්‍රව ඒ රටවල දියුණු වී ඇත. අධ්‍යාපන උපකරණයක් ලෙස ද අධ්‍යාපන මාධ්‍යයක් ලෙස ද එය බහුලව පාසැල් පංක්තිවල යුරෝපීය රටවල යොදනු ලැබේ. ඕනෑ ම පාඩමක් ඉගෙන ගැනීමේදී පොත පත කියවා ලබන දැනුමට වඩා රූකඩ මාර්ගයෙන් පාඩමක් හෝ කථාවක් හෝ නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමෙන් ලබන ඉගෙනීම හා ආස්වාදය ඉමහත් බැව් පර්යෙෂණවලින් හෙළි වේ. ප්‍රාථමික පංක්තිවල සිසුන් රූකඩ තැනීමෙන් ලබන අත්දැකීම් නිසා අධ්‍යාපනයේ නියම ප්‍රයෝජනය ඔවුන් ඒනයින් ලබන බව ද අධ්‍යාපනඥයින්ගේ මතය යි. ඉගෙනගැනීමෙහි දක්ෂ නොවන සිසුන් ද මානසික දුර්වලකම් සහිත සිසුන් ද රූකඩ ක්‍රියා කිරීමෙන් ප්‍රකෘතිමත් වන බව ඔවුන් එවැනි අභ්‍යාසවල යෙදවූ ගුරුවරුන්ගේ අත් දැකීම යි. මේ සියළු ම ප්‍රයෝජනවලට වඩා අනඟි ලෙස සැලකිය හැක්කේ රූකඩ සාදා නැටවීමෙන් ඔවුන් අනුක්‍රමයෙන් ලබන නාට්‍ය කලාව පිළිබඳ පුහුණුවයි.

අධ්‍යාපනමය රූකඩ වශයෙන් හැම රටක ම වාගේ භාවිත කරනුයේ අත් රූකඩ ය (glove puppets). මෙය පෙනුමෙන් බෝනික්කකුට සමාන ය. මැටි හිස් සැලැස්මක් වටා කඩදාසි කැබලි සහ පාප්ප සංයෝගකොට සාදගත් මිශ්‍රණය කිහිප වාරයක් අතුරා හිස් කබලක් සාදගෙන එයට සුදුසු ඇඳුම් හා උපකරණ එක්කොට ගැනීමෙන් පහසුවෙන් මේ රූකඩ වර්ගය තනා ගත හැකි ය. පුංචි ඔලොගුවකට අත දමන්නාක් මෙන් රූකඩයේ හිස දක්වා අත ඇඟිලි දෙකක් බහා සෙසු ඇඟිලි රූකඩයේ අත් දෙකට බහා මේ රූකඩය ක්‍රියා කරවනු ලැබේ. එංගලන්තයේ පාසැල් කිහිපයක ම මේ වර්ගයේ රූකඩ භාවිත කරනු ලැබේ. මේ පිළිබඳව අභ්‍යාස විද්‍යාල ගුරුවරු විශෙෂයෙන් ම පුහුණුවක් ලබත්, පාසැල් ගුරුවරු ද ඉගැන්වීමෙහි දී අත් රූකඩ

ක්‍රම යොදත්. මේ අත් රූකඩ කලාව ප්‍රචලිත කිරීමෙහි ද එංගලන්තයෙහි හා වෙනත් රටවල් කිහිපයක ම එය ප්‍රචාරය කිරීමෙහි ද දීර්ඝ කාලයක් තුළ නිරත වූ ආයතනය නම් ලන්ඩනයෙහි පිහිටි **අධ්‍යාපනමය රූකඩ සමිතිය** යි. අද එංගලන්තයේත් පොදුරාජ්‍යමණ්ඩලීය රටවල් කිහිපයකත් අත් රූකඩ කලාව ජනප්‍රිය වී ඇත්තේ මේ සමිතියේ සාමාජිකයන්ගේ උද්‍යොගය හා ක්‍රියාශීලී ව්‍යාපාරය නිසා ය. ලංකාවෙහි ද පාසැල් සිසුන් අතර මේ රූකඩ කලාව උගැන්වීම ඉතා පහසු බැව් අපගේ හැඟීම යි. දැනට පාසැල්වල ඉටිවලින් කරන අත්වැඩ හා සායම් කිරීම පිළිබඳ අභ්‍යාසවලින් සිසුන් යම් කිසි අත්දැකීමක් ලබනු නිසැක ය. එවැනි අභ්‍යාස අත් රූකඩ සෑදීම හා නාට්‍ය ස්වරූපයෙන් ඒවා රඟ දැක්වීමේ ක්‍රමවත් වැඩ පිළිවෙළකට සම්බන්ධ කොට යෙදීමෙන් ඔවුන්ගේ බුද්ධිය පළල් වනු පමණක් නොව ඔවුන්ගේ නිර්මාණ ශක්තිය ද දියුණු වේ.

මෙසේ අධ්‍යාපනමය රූකඩ කලාව පාසැල්වල හැදෑරීමෙන් පාසැල් සිසුන් අතර රූකඩ කලාව පිළිබඳ මනා අවබෝධයක් හා පරිචිතියක් ඇති වේ. එපමණක් නොව ඔවුන් අතර පැරණි රූකඩ කලාව කෙරෙහි රුචිකත්වයක් ද නිරුත්සාහයෙන් උපදී. එබඳු රුචිකත්වයක් හා පරිචිතියක් ඇතිවීමෙන් කලායතන වැනි ආයතනයන්හි රූකඩ කලාව නියම කලාවක් ලෙස හැදෑරීමට සමත්, යෝග්‍ය කලාකරු පිරිසක් ද බිහි වනු නියත ය. මෙලෙස බුද්ධිමත් රූකඩ කලාකරුවන් සමූහයක් අතින් ලංකාවේ රූකඩ කලාව ද නිසි ලෙස හැඩ ගැසී විශිෂ්ටතම රූකඩ නාට්‍ය සම්ප්‍රදායයක් අපට ද හිමි වන්නේය.